සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**54 S I**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2010 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2010 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2010

# පෙරදිග සංගීතය I
# கீழைத்தேய சங்கீதம் I
# Oriental Music I

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

✻ **පළමුවැනි** ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
(පළමුවැනි ප්‍රශ්නය **1.1** සිට **1.20** තෙක් කෙටි ප්‍රශ්න **20**කින් සමන්විත වේ.)

1. • අංක **1.1** සිට **1.5** තෙක් දී ඇති ප්‍රශ්නවලට අදාළ ඉතාමත් ම **නිවැරදි** පිළිතුර වරහන් තුළ දක්වා ඇති පිළිතුරුවලින් තෝරාගෙන පිළිතුරු පත්‍රයේ **ප්‍රශ්න අංකය සමග** ලියන්න.

1.1 ආචාර්ය ප්‍රේමසිරි ඛේමදාස ශූරීන් මෙරට ව්‍යවහාරික සංගීත ක්ෂේත්‍රයේ නව මහක් ගත් නිර්මාණ රාශියක් බිහි කළ සංගීතඥයෙකි. එතුමන් අතින් සංගීත නිර්මාණය නොවූ කලා කෘතිය කුමක් ද?
(සත්සමුදුර, දඬුබස්නාමානය, අග්නි, මානසවිල, ගොළුහදවත)

1.2 මෑත කාලයේ අප අතරින් වියෝ වූ ගායන ශිල්පී අබේවර්ධන බාලසූරිය මහතා ගායනයෙන් හවුල් වූ ජනසංගීතාශ්‍රිත සරල ගීතය කුමක් ද?
(අඳුරුකුටිය තුළ, අම්මාවරුනේ, වක්කඩ ළඟ දිය, සඳ දයාලු නෙලුම, රෑ පැල් රකින)

1.3 "පැරණි සරල ගී බොහොමයක් වංග සංගීතය ආශ්‍රිත ව නිර්මාණය වී ඇත." මෙම කියමනට අදාළ **නො වන** ගීතය කුමක් ද?
(අක්කෙ අක්කෙ අර, පොඩිමල් එතනෝ, දුරපෙනෙන තැනිතලා, වරෙන් හීන්සැරේ, බැස සීතල ගඟුලේ)

1.4 "මෙන්න තොපිට වාසියක් නට නටා වරෙව්" මෙම ගීතය ඇතුළත් වන නාට්‍යය කුමක් ද?
(බෙරහඬ, නරිබෑණා, තාරාවෝ ඉගිලෙති, මානසවිල, කැලණි පාලම)

1.5 ශ්‍රී ලාංකේය චිත්‍රපට සංගීතයේ මුල් ම ස්වතන්ත්‍ර ගී තනු ඉදිරිපත් කළ චිත්‍රපටය කුමක් ද?
(අශෝකමාලා, සැඩසුළං, කඩවුණු පොරොන්දුව, මාතලන්, සංදේශය)

• පහත දැක්වෙන වගුවේ **"අ"** කොටසේ දැක්වෙන ජන ගීවලට **"ආ"** කොටසේ දැක්වෙන ස්වර ප්‍රස්තාර කොටස් සම්බන්ධ ය. අංක **1.6** සිට **1.10** තෙක් ප්‍රශ්න අංකවලින් දැක්වෙන තොරතුරට අදාළ ජන ගීතය සහ ප්‍රස්තාර කොටස යන දෙක ම වගුවෙන් තෝරන්න. නිවැරදි පිළිතුර හෝ ඒවාට ගැළපෙන **ඉංග්‍රීසි අක්ෂරය** සහ **රෝමානු අංකය** හෝ **ප්‍රශ්න අංකය ඉදිරියෙන්** ලියන්න.

| "අ" | "ආ" |
|---|---|
| (a) වරම් වරම් සක්‍ර මහබඹු | (i) ග - ග ග ග - රි ස ස ස ස සරිග - |
| (b) ගුණ දනේ බෝසත් අනේ | (ii) සසස සරිස / රිසස සරිග / රිසස සරිග / රිරිරි රිගස |
| (c) තේමිය ජාතියේ බෝසත් | (iii) ස ප ප / ප - ධ ප / ම ප ම / ග රි ස නි / |
| (d) උපත පෙරා කළිඟු පුරා | (iv) + ම ම / ම ම ම / ම ම ගරි / ස රි සනි / |
| (e) ඕඩි හෙලේ හෙල වටකර | (v) ස - ස රි / ග - ග රි / ස රි රි රිස / ස - ස - / |

1.6 ජීවිතයත් මරණයත් අතර සටනක් සේ දැක්වෙන ගැමියන් විසින් කරනු ලබන රැකියාවක් හා සම්බන්ධ ගී විශේෂයකි.

1.7 පහතරට ශාන්තිකර්ම ගීතයකි.

1.8 සබරගමු ශාන්තිකර්ම ගීතයකි.

1.9 හොරණෑ ඕසයට අයත් ගීතයකි.

1.10 ගොයම් කැපීමේ දී ගායනය කළ ගැමි ගීයකි.

[ දෙවෙනි පිටුව බලන්න.

- අංක **1.11** සිට **1.13** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු පහත දැක්වෙන ස්වර ප්‍රස්තාර කොටස් ආශ්‍රයෙන් සපයන්න.

(අ) + සස ස / රි ම රි / ම - ප / ධ ස̇ ධ / ම ම ධ / ප - - / - - - /

(ආ) + + + / ස රි ම ම / ප නි - / ධ - ප - / ග ග- / රි ස රි ස / ස - - / ස - - - /

(ඉ) ප ධ නි - / නි ස̇ නි ධ / ප ප ධ - / ප ම්‍ප ග රි /

1.11 රබන් පද ආශ්‍රිත ව සංගීත නිර්මාණය කළ නාට්‍ය ගීතයට අයත් ස්වර ප්‍රස්තාර කොටස් තෝරා එම නාට්‍යයේ නම ලියන්න.

1.12 හින්දුස්තානි සංගීතය ආශ්‍රිත නූර්ති ගීතයට අයත් ස්වර ප්‍රස්තාර කොටස තෝරා එම නූර්තියේ නම ලියන්න.

1.13 කතෝලික ආගම හා සම්බන්ධ ගීතයට අයත් ස්වර ප්‍රස්තාර කොටස තෝරා එම ගීතයේ නම ලියන්න.

- අංක **1.14** සිට **1.15** තෙක් ප්‍රශ්නවලට ඉතාමත් ම නිවැරදි පිළිතුර තෝරා, පිළිතුරු පත්‍රයේ **ප්‍රශ්න අංකය සමග** ලියන්න.

1.14 "මුද්ගරිකාව, තිසාතිය සහ දරණකය" යන කොටස් නාම **තුන,**
(1) වයලීන් පවුලට අයත් සංගීත භාණ්ඩයකට අයත් ය.
(2) ස්වරාලය හා සම්බන්ධ කොටස් නාම තුනකි.
(3) කර්ණේන්ද්‍රිය හා සම්බන්ධ කොටස් නාම තුනකි.
(4) තබ්ලාව හා සම්බන්ධ කොටස් නාම තුනකි.
(5) වීණාව හා සම්බන්ධ කොටස් නාම තුනකි.

1.15 පාසල් සංගීත අධ්‍යාපනය පිළිබඳ තොරතුරු අතර 1934 වර්ෂය හා බැඳුණු ඓතිහාසික කරුණ කුමක් ද?
(1) නිදහස් අධ්‍යාපනය යටතේ මධ්‍ය මහා විද්‍යාලයකට ප්‍රථමවරට සංගීත ගුරුවරයකු පත්කිරීම
(2) පාසල් සංගීත නිර්දේශ පත්‍ර සකස්වීම
(3) ලංකා ගාන්ධර්ව සභාව මගින් රජයේ සංගීත විද්‍යාලය ආරම්භ කිරීම
(4) සංගීත ගුරු පුහුණුව සඳහා ගුරු විද්‍යාලක් ඇති වීම
(5) තාගෝර්තුමාගේ ලංකාගමන සහ ශ්‍රීපාලිය බිහිවීම

- පහත දැක්වෙන ඡේදයේ **1.16** සිට **1.20** තෙක් හිස්තැන්වලට සුදුසු වචනය හෝ වචන හෝ හිස්තැනට අදාළ **අංකය සමග නිවැරදි පිළිතුර ලියා** දක්වන්න.

ශ්‍රී ලංකාවේ ශාන්තිකර්ම උඩරට, පහතරට හා සබරගමු වශයෙන් තෙවැදෑරුම් ය. සබරගමු ශාන්තිකර්මවල දී (1.16) .......................... ප්‍රධාන මඩුව වන අතර පහතරට ශාන්තිකර්මවල දී (1.17) .................................. ප්‍රධාන මඩුව වේ. පහතරට ශාන්තිකර්ම ගීතයක් වන "සැරි සොඳට බැඳි වරසල දිලෙන්නේ" යන ගීතය (1.18) ........................................... නැටුමට අයත් වන අතර එම නැටුම ගර්භ සංරක්ෂණය සඳහා පවත්වන (1.19) .................................... අයත් වේ. පහතරට ශාන්තිකර්මවල දී හදි හූනියම් නැතිකිරීම සඳහා සූනියම් යකුම පවත්වන අතර ශාන්තිය උදෙසා (1.20) ................................ පවත්වනු ලැබේ.

**2.** ශ්‍රී ලාංකේය ජන සංගීතය ගැමි ගී සහ සේ ගී වශයෙන් වර්ග දෙකකි. ඒ අතුරෙන් ගැමි ගී බොහොමයක් අනාඝාතාත්මක ය.
(i) අනාඝාතාත්මක මෙහෙ ගී විශේෂ නම් කර එම ගී ගායනයේ දී අනාඝාතාත්මක වූයේ මක්නිසාද'යි පැහැදිලි කරන්න.
(ii) කවිකාර මඩුව ආශ්‍රිත ව නිර්මාණය වූ සේ ගී විශේෂ **දෙකක්** නම් කර ඒවා අතර සම විෂමකම් දක්වන්න.
(iii) උඩරට වන්නම්වලින් පහතරට සිංදු වන්නම් වෙනස් වන අයුරු කෙටියෙන් පැහැදිලි කරන්න.
(iv) ඉහත කොටස්වලින් ඔබ කැමති කොටසකට අයත් ගීයක මුල් පාද දෙක ගීත ස්වර ප්‍රස්තාර කරන්න.

**3.** පහත දැක්වෙන්නේ නිර්දේශිත ජන ගී වර්ගවලට අයත් ගී පාදයන් ය.
(a) දඩිබිඩි ගගා කරනා වැඩ රටවටියේ - කළුවන් කළු රුවයි මංගෝ දිලිසෙනවා
(b) තේමිය ජාතියේ බෝසත් උපන්නේ - වරම් වරම් සක්‍ර මහබඹු අතින් වරම්
(c) මොහු හැර වෙනදත් ගන්නෝ නැද්දේ - සැහැවී පන ගොස් කුරුසේ මත වැඩ
(i) ඉහත ගී පාද අයත් ජන ගී වර්ග නම් කරමින් එක් එක් කොටසට අයත් ගී වර්ග අතර සැසඳීමක් කරන්න.
(ii) ඉහත දැක්වෙන ජන ගී අතුරෙන් **එක්** ජන ගීයක මුල් පාද දෙක ගීත ස්වර ප්‍රස්තාර කරන්න.

[ තුන්වෙනි පිටුව බලන්න.

**4.** ශ්‍රී ලංකාවේ සංගීත වර්ධනයට එක් එක් යුගවල දී වෙනත් සංගීත ක්‍රමවල බලපෑම සිදුවී ඇත.

(i) පහත දැක්වෙන කොටස් අතුරෙන් **දෙකක්** තෝරාගෙන පිළිතුරු සපයන්න.

(a) මහනුවර යුගයෙන් පසු කර්ණාටක සංගීතයේ බලපෑම නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න.

(b) හින්දුස්තානි සංගීතය මෙරට සංගීත ක්ෂේත්‍රයට බලපා ඇති ආකාරය නූර්ති නාට්‍ය, භාරතීය චිත්‍රපට සහ තාගෝර්තුමාගේ ලංකා ගමන ඇසුරෙන් පැහැදිලි කරන්න.

(c) වංග සංගීතය මෙරට සංගීත ක්ෂේත්‍රයට බලපා ඇති ආකාරය ශාන්ති නිකේතන අධ්‍යාපනය, මුල්යුගයේ මෙරට සරල ගී සහ එම නිර්මාණකරුවන් ඇසුරෙන් පැහැදිලි කරන්න.

(ii) ඔබ තෝරාගත් කොටස් දෙකට ගැළපෙන ගීත **දෙකක** මුල් පාද **දෙක** බැගින් ගීත ස්වර ප්‍රස්තාර කරන්න.

**5.** කෝලම් යනු ශ්‍රී ලංකාවේ පැරණිතම රංග සම්ප්‍රදායන් අතුරෙන් එකකි.

(i) කෝලම් රංග ශෛලිය ව්‍යාප්ත වූ ප්‍රදේශ මොනවා ද?

(ii) කෝලම් රංගනයක් ඉදිරිපත් කරනු ලබන ආකාරය හෙවත් රංග ශෛලිය පිළිබඳ කෙටි විස්තරයක් කරන්න.

(iii) කෝලම් ගීතයක පළමු පාද **දෙක** ගීත ස්වර ප්‍රස්තාර කර එම සංගීත ශෛලියේ සුවිශේෂතා **තුනක්** දක්වන්න.

(iv) හාස්‍යොත්පාදක ව සමාජයේ දුර්වල තැන් දක්වමින් ඉදිරිපත් කළ නාටක විශේෂයක් ලෙසට කෝලම් සම්ප්‍රදාය අගයන්න.

**6.** ශ්‍රී ලාංකේය සංගීතය තුළ ගායන මෙන්ම වාදන අංග ද, ඇතුළත්ව ඇත.

(i) හේවිසි වාදනය සහ පංචතූර්ය වාදනය පැහැදිලි කරමින් ඒවා අතර වෙනස දක්වන්න.

(ii) පංචතූර්ය වාදනය ශ්‍රී ලංකාවේ ඓතිහාසික වාදන විශේෂයක් බව සනාථ කරන්න.

(iii) පාසලේ විවිධ ප්‍රසංගයක් සඳහා ඔබේ කණ්ඩායම සමඟ පංචතූර්ය වාදනයක් ඉදිරිපත් කිරීම, ඔබ විසින් නිර්මාණය කරන ආකාරය පැහැදිලි කරන්න. අවශ්‍ය අවස්ථාවල දී පද හෝ රිද්ම හෝ කොටස් ප්‍රස්තාර කර දක්වන්න.

**7.** පහත දැක්වෙන්නේ "වෙසක් භක්ති ගී" මාතෘකාව යටතේ සංගීත නිර්මාණ පාඩම් හා සම්බන්ධ ව පාසල පදනම්කර ගත් ඇගයීම් වැඩසටහනකට අදාළව සිසුන් කණ්ඩායමක් විසින් නිමකරන ලද සංගීත නිර්මාණයක කොටසකි. එය ඔබේ පිළිතුරු පත්‍රයේ සටහන් කර, පහත කොටස්වලට පිළිතුරු සපයන්න.

X X X X

ප ගු ස නි / ප - - - / ධ - ස ධ / ප - - - /

.............. / ............ / ............ / ............ /

X X X X

ප නි රි ම / ගු ප නි ප / ගු රි ස රි / ස - - - /

.............. / ............ / ............ / ............ /

The National e-learning Portal for The General Education

(i) මෙම නිර්මාණයේ මූලික තනුව (Melody) නිර්මාණය කර ඇත්තේ කුමන ස්කේලයක් (Scale) පදනම් කරගෙන ද?

(ii) පහතින් දැක්වෙන්නේ මූලික තනුවට ගැළපෙන ලෙස නිර්මාණය කළ ප්‍රතිධ්වනි (Counter) නම් කොටසකි. එහෙත් එය ප්‍රස්තාර කිරීමේ දී විභාග අටට නියමිත කොටස් සිසුන් අතින් මාරු වී වැරදි ලෙස සටහන් වී තිබුණි. එම විභාග අටට අදළ ප්‍රතිධ්වනි (Counter) කොටස් නිවැරදි ලෙස මූලික තනුව සමඟ ප්‍රස්තාර කරන්න.

ම - - - / ගු - - - / ගු - - - / ප නි + නි + නි + /

ම ප + ප + ප + / ප - නි - / ගුරි සරි ස - / ස් - - - /

(iii) C - Minor seventh යන කෝඩ් එක ශ්‍රී ලාංකේය ව්‍යවහාරික සංගීතයේ දී ප්‍රස්තාරයක් තුළ ලියා දක්වන්නේ $C^{m7}$ යනුවෙනි. ඒ අනුව **C** Minor, **C** Minor seventh, **G** Minor, **G** Minor seventh, **E** flat Major, **F** Minor යන කෝඩ්ස් ඉහත ප්‍රස්තාරයේ X ලකුණ දක්වෙන ස්ථානවලට වඩාත් ම ගැළපෙන ලෙස ලියා දක්වන්න.


(iv) ඉහත නිර්මාණයේ මූලික තනුව (Melody) **F** - Minor ස්කේලයට පෙරළා ප්‍රස්තාර කර දක්වන්න.

8. පහත දක්වෙන බටහිර සංගීත ප්‍රස්තාර කොටස් ශ්‍රී ලංකාවේ ප්‍රචලිත ගී විශේෂයකට අයත් ය. එම ප්‍රස්තාර කොටස් ආශ්‍රයෙන් පිළිතුරු සපයන්න.

(ඇ)




(ආ)



(i) ඉහත (ඇ) සහ (ආ) ප්‍රස්තාර කොටස් පෙරදිග ක්‍රමයට පෙරළා ප්‍රස්තාර කරන්න.

(ii) (ඇ) ප්‍රස්තාර කොටසේ අංක 1 සිට 10 තෙක් සංකේත නම් කරන්නේ කෙසේ ද?

(iii) එම ස්වර ප්‍රස්තාර කොටස් අයත් වන ගී විශේෂය නම් කරන්න.

(iv) පහත දක්වෙන මාතෘකා ද ඇතුළත් වන පරිදි එම ගී විශේෂය පිළිබඳ බිත්ති පුවත් පතකට ලිපියක් ලියන්න.

(a) මෙම ගී විශේෂය ශ්‍රී ලංකාවේ ප්‍රචලිත වූ දශකය

(b) මෙම ගී විශේෂයේ සංගීතමය ලක්ෂණ (ගී තනු සහ පාදක කරගත් සංගීත ශෛලීන් ආදිය)

(c) ගීත නිර්මාණ කළ සංගීතඥයින් සහ ගායක ගායිකාවන් අතුරෙන් කිහිප දෙනකු

(d) නිදසුන් සඳහා ගී කිහිපයක මුල් පාද

***

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**54 | S | II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2010 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2010 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2010

| | |
|---|---|
| පෙරදිග සංගීතය II<br>கீழைத்தேய சங்கீதம் II<br>**Oriental Music II** | පැය තුනයි<br>மூன்று மணித்தியாலம்<br>*Three hours* |

✻ **පළමුවැනි** ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
(පළමුවැනි ප්‍රශ්නය **1.1** සිට **1.20** තෙක් කෙටි ප්‍රශ්න **20**කින් සමන්විත වේ.)

1. • අංක **1.1** සිට **1.5** තෙක් දී ඇති ප්‍රශ්නවලට අදාළ ඉතාමත් ම **නිවැරදි** පිළිතුර වරහන් තුළ දක්වා ඇති පිළිතුරුවලින් තෝරාගෙන පිළිතුරු පත්‍රයේ **ප්‍රශ්න අංකය සමග** ලියන්න.

1.1 භාරතීය ශාස්ත්‍රීය සංගීතය හා සම්බන්ධ ඉදිරිපත් කිරීමක දී ශ්‍රැතිය තබා ගැනීම සඳහා යොදා ගැනීමට වඩාත් ම උචිත තන්ත්‍රිය භාණ්ඩය,
(ශ්‍රැති මංජුසාව / සර්පිනාව / වයලීනය / ස්වර මණ්ඩලය / තාම්පුරාව)

1.2 සර්පිනාවක මන්ද්‍ර නිෂාදය ශ්‍රැතිය වශයෙන් සලකා "නිස ග ම ප නි" යනුවෙන් වයන ආරෝහණය අයත් වන්නේ කුමන රාගයට ද?
(මාල්කෞන්ස් / භීම්පලාසි /දුර්ගා / බිහාග් / බ්‍රින්දමනීසාරංග)

1.3 හින්දුස්තානි තාලපද අතුරෙන් චෞතාලයට බෙහෙවින් සමාන තාලය,
(ඒක්තාල් / දීප්චන්දි / ඣප්තාල් / ත්‍රීතාල් / කෙහෙර්වා)

1.4 ගීතයක හෝ වාදිතයක හෝ සමග්‍රහයට පතිත වන සේ නිර්මාණය වී ඇති සමග්‍රහයට පෙර, ගයන / වයන ගීත හෝ වාදිත හෝ කොටස හඳුන්වන්නේ කුමන නමකින් ද?
(ඛ්‍යාලා / ගත් / මුඛඩා / පකඩ් / තිහායි)

1.5 සාමාන්‍ය ව්‍යවහාරයේ "ජිල්" යනුවෙන් භාවිත වන්නේ කුමක් ද?
(ඩග්ගා / බායාං / තබ්ලි / දයාං / තුම්බා)

• අංක **1.6** සිට **1.10** තෙක් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

1.6 තානාලංකාර වෙනුවට ගීතය ම සම, දෙගුණ වශයෙන් ගුණ කරන ගායන ශෛලියක් නම් කරන්න.

1.7 අදාරංග හෝ සදාරංග හෝ සංගීතඥයන් විසින් තීලවඩා හෝ ඒක්තාල් මත රචනා කළ ගායන ශෛලිය කුමක් ද?

1.8 රාගයේ ලක්ෂණ ඇතුළත් ගීත ශෛලිය කුමක් ද?

1.9 තිල්ලානා ගායන ශෛලියට බෙහෙවින් සමාන උතුරු ඉන්දීය ගායන ශෛලිය කුමක් ද?

1.10 වර්ණම්වලට සමාන උතුරු ඉන්දීය ගායන ශෛලිය කුමක් ද?

• අංක **1.11** සිට **1.16** තෙක් ප්‍රශ්නවලට අදාළ පිළිතුරුවලින් ඉතාමත් ම නිවැරදි පිළිතුර තෝරා, පිළිතුරු පත්‍රයේ **ප්‍රශ්න අංකය සමග** ලියන්න.

1.11 අවශ්‍ය වූ විටෙක දදරා තාලයේ ගතිලක්ෂණයට අනුව වාදනය කළ හැකි මාත්‍රා **දෙක** බැගින් විභාග වන තාලය වන්නේ,
(1) ඣප්තාලයයි. (2) දීප්චන්දි තාලයයි. (3) ත්‍රීතාලයයි.
(4) ඒක්තාලයයි. (5) ධමාර්තාලයයි.

1.12 මාත්‍රා 2, 3, 4, 5 යන සංඛ්‍යා සියල්ලේ ම විභාග ඇතුළත් තාල පදය වන්නේ
(1) ඣප්තාලයයි. (2) දීප්චන්දි තාලයයි. (3) ත්‍රීතාලයයි.
(4) ඒක්තාලයයි. (5) ධමාර් තාලයයි.

1.13 ආඝාතය තබා සමග්‍රහය **නො දක්වන** තාල පදයක් වනුයේ,
(1) ඒක්තාල් (2) චෞතාල් (3) රූපක්
(4) ඣප්තාල් (5) ත්‍රීතාල්

[ දෙවෙනි පිටුව බලන්න.

1.14 දකුණු ඉන්දීය සංගීතයට අයත් ඉපියාව සහිත වාද්‍ය භාණ්ඩයක් වනුයේ,
(1) වීණාව (2) සයම් (3) නාදස්වරම්
(4) තවිල් (5) මෝලම්

1.15 එකිනෙක ස්වරවලට වෙන වෙන ම තත් රාශියක් ඇති, ප්‍රධාන තතක් නැති සංගීත භාණ්ඩය වනුයේ,
(1) සරෝද් (2) සන්තූර් (3) සාරංගි
(4) සිතාර් (5) වීණා

1.16 ග ම ප ස් / නි - ප - / ප ම් ග ම / ග - ස - / (ස)
මෙම ස්වර පාදයේ,
(1) දෙවන විභාගයේ මීන්ඩ් ස්වරයක් ද, සිව්වන විභාගයේ කණ් ස්වරයක් ද දක්වේ.
(2) දෙවන විභාගයේ කණ් ස්වරයක් ද, සිව්වන විභාගයේ මීන්ඩ් ස්වරයක් ද දක්වේ.
(3) දෙවන විභාගයේ මීන්ඩ් ස්වරයක් ද, සිව්වන විභාගයේ මූර්කි ස්වරයක් ද දක්වේ.
(4) දෙවන විභාගයේ මූර්කි ස්වරයක් ද, සිව්වන විභාගයේ කණ් ස්වරයක් ද දක්වේ.
(5) දෙවන විභාගයේ ගමක් ස්වරයක් ද, සිව්වන විභාගයේ කණ් ස්වරයක් ද දක්වේ.

- අංක **1.17** සිට **1.20** තෙක් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

1.17 බිහාග් රාගයේ සුවිශේෂ ලක්ෂණයක් ලියන්න.

1.18 භාගේශ්‍රී රාගයේ ජාතිය පිළිබඳ මත තුනක් දක්වේ. ඒවා මොනවා ද?

1.19 ඛමාජ් මේලගත සහ බිලාවල් මේලගත වශයෙන් දෙයාකාරයක් ඇත්තේ කුමන රාගයේ ද?

1.20 මධ්‍යමය දෙයාකාරයෙන් ම යෙදෙන කෝමල 'නි' විවාදි ස්වරයක් වන රාගය කුමක් ද?

**2.** (i) නිෂාදය ශුද්ධ සහ කෝමල යන දෙයාකාරයෙන් ම යෙදෙන නිර්දේශිත රාග **තුනක්** නම් කරන්න.
(ii) ඉන් ඖඩව ජාති රාගයට අදාළ මධ්‍යලය ගීතයක් ස්ථායි අන්තරා වශයෙන් ගීත ස්වර ප්‍රස්තාර කරන්න.
**නැතහොත්**
ස්වර පමණක් ප්‍රස්තාර කර ඊට ගැළපෙන තානාලංකාර **දෙකක්** තාලානුකූලව ප්‍රස්තාර කරන්න.
(iii) ප්‍රස්තාර කළ ගීතය හෝ වාදිතය හෝ අයත් තාලය සම දෙගුණ වශයෙන් ප්‍රස්තාර කරන්න.

**3.** මෝගල් යුගය භාරතීය සංගීතයේ සංගීත භාණ්ඩ රාශියක් නිර්මාණය වූ යුගයකි.
(i) පහත ප්‍රකාශවලින් දක්වෙන තත්ත්වයන් සංගීත භාණ්ඩයේ නිකුත්වන හඬෙහි දුර්වලතා ඇති කිරීමට හේතු වේ. එසේ වන අයුරු පැහැදිලි කරන්න.
(a) සිතාරයේ ප්‍රධාන තත හා සම්බන්ධ "මන්කා" නොමැති වීම
(b) සිතාරයේ මන්ද්‍ර ස්වරවල සිට උච්ච ස්වර දක්වා "ප්‍රේවිස්" බැඳ ඇත්තේ ක්‍රමයෙන් උසින් අඩුවන අයුරෙනි; මෙම පිළිවෙළ නොමැති වීම
(c) සිතාරයේ ජවාරි නොතිබීම
(d) තබ්ලාවේ ස්‍යාහි කොටස ඉවත්ව තිබීම
(e) තබ්ලාවේ බද්දි, ගට්ටාවලින් ඉවත්ව තිබීම
(ii) ඉහත සංගීත භාණ්ඩ නිර්මාණය කළ සංගීතඥයා නම් කර එතුමන් අතින් භාරතීය සංගීතයේ වර්ධනයට සිදුවූ වෙනත් සේවාවන් දක්වන්න.

**4.** භාරතීය සංගීතයේ වර්ධනය සහ විකාශය සඳහා ආගමික ගී, ගෝත්‍රික ගී, පද්‍ය ප්‍රබන්ධ සහ සංගීතඥයින්ගේ පරිශ්‍රමය යන කරුණු හතර මූලික වී ඇති බව සංගීතඥයෝ පිළිගනිති.
(i) ආගමික ගී මූලාශ්‍ර වූ අයුරු පහත දක්වෙන කොටස් අනුව නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න.
(a) වේද ගායනයට පසුබිම් වූ නාදස්ථාන තිබූ බව, ඒවා ගීතිකා මත ලකුණු කළ බව
(b) ස්වර ප්‍රස්තාරකරණය පිළිබඳ ඓතිහාසික තොරතුරු සාම ගීතිකාවලින් පැහැදිලි වන බව
(ii) ගෝත්‍රික ගී රාග නිර්මාණයේ දී බලපා ඇති අයුරු පැහැදිලි කරන්න.
(iii) සංගීතඥයින්ගේ පරිශ්‍රමය මූලාශ්‍ර වූ අයුරු භාත්ඛණ්ඩේ පඬිතුමාගේ සේවාව මගින් පැහැදිලි කරන්න.

**5.** පහත දක්වෙන ප්‍රකාශ හා සම්බන්ධ රාග නම් කර, ඒවායේ ථාටය (මේලය) ආරෝහණ, අවරෝහණ, ජාතිය, වාදි, සංවාදී, මුඛ්‍යාංගය, ගානසමය" යන රාග විස්තර සපයන්න.
(i) තීව්‍ර මධ්‍යමය විවාදි ස්වරයක් ලෙස යෙදෙන රාගය
(ii) නිෂාදය දෙයාකාරයෙන් යෙදෙන ඖඩව ජාති රාගය
(iii) ඛමාජ් මේල ගත නිර්දේශිත රාගය
(iv) ශුද්ධ ස්වර පමණක් යෙදෙන ඖඩව ජාති රාගය
(v) නි, සරිග, -, යනුවෙන් විශේෂ ස්වර සංගතියක් යෙදෙන රාගය

[ තුන්වෙනි පිටුව බලන්න.

6. (i) පහත කොටස්වල ගායන ශෛලීන් අතර සම විෂමකම් දක්වන්න.

(a) ධ්‍රැපද් - ධමාර් (b) ගසල් - තරාණා

(ii) ඉහත ගායන ශෛලීන් එකකට අයත් ගීතයක ස්ථායි කොටස ගීත ස්වර ප්‍රස්තාර කරන්න.

(iii) ඛ්‍යාල් ගීතවලට වඩා ධ්‍රැපද් - ධමාර් ගීත ගායනා කිරීම අපහසු බව ශ්‍රී ලංකාවේ පිළිගත් මතයකි. මෙය විමසන්න.

7. පහත දක්වෙන වගුවේ නිර්දේශිත රාගවලට අයත් වන ලෙස සකස් කළ රාගාශ්‍රිත නිර්මාණවල මුල් කොටස් ඇතුළත් ය.

(i) එම වගුවේ "අ" කොටසේ දක්වෙන A, B, C, D, E යන ස්වර කොටස්වලට ගැළපෙන කොටස් "ආ" කොටසින් තෝරා පළමු පාදය සකසන්න.

| "අ" කොටස | "ආ" කොටස |
|---|---|
| (A) ස ස ම - / ම ප ග ම / | ස - ම ම / ම - ග ම / |
| (B) ස රි ම ප / නි - ස් රි් / | ම ධ නි ධ / ම ග රි ස / |
| (C) ග ම ග ස / නි̣ ස ධ̣ නි̣ / | නි ධ ප ම / ග රි ග ස / |
| (D) ස රි ම ප / ධ - ප - / | ධ - නි - / ස් - - - / |
| (E) ස නි̣ ධ̣ නි̣ / ස - ම ග / | ම ප ධ ප / ම ග රි ස / |

(ii) එම ස්වර පාදවලට ගැළපෙන ලෙස දෙවන පාදයක් බැගින් නිර්මාණය කරන්න.

(iii) එම නිර්මාණ කොටස් අයත් රාග නම් කරන්න.

(iv) එම රාග අතුරෙන් මධ්‍යමය සහ සඩ්ජය වාදී සංවාදී වන රාගයක් නම් කර ඊට අයත් වන ලෙස ස්වර තිහකට නොඅඩු ආලාප ඛණ්ඩයක් නිර්මාණය කරන්න.

(v) ඉහත රාග අතුරෙන් දිවා කාලයේ ගායනයට සුදුසු රාගයට අයත් මධ්‍යලය ගීතයක හෝ වාදිතයක හෝ ස්ථායි කොටස ස්වර ප්‍රස්තාර කරන්න.

8. පහත දක්වෙන්නේ පාසල පදනම්කරගත් ඇගයීම හා සම්බන්ධ ශිෂ්‍යයකු විසින් ගොඩනැගූ වගුවකි.

(i) එම වගුව පහත උපදෙස් මත නැවත සකස් කර ඔබේ පිළිතුරු පත්‍රයේ පිටපත් කරන්න.

- එහි විශේෂ ලක්ෂණ තීරුවට අදාළව A, B, C, D වශයෙන් දක්වා ඇති සංගීත භාණ්ඩ නම් කරන්න.
- සුවිශේෂව සම්බන්ධවන සංකල්ප එක් එක් සංගීත භාණ්ඩයට අදාළ නො වන සේ මාරු වී ඇත. එම සංකල්ප නිවැරදි සංගීත භාණ්ඩය අයත් පේළියට ඇතුළත් කරන්න.
- පහත වරහන තුළ ඇති සංගීත භාණ්ඩවලට අයත් කොටස්වල නාම දොළොස, එක් සංගීත භාණ්ඩයකට **තුන** බැගින් නිවැරදිව ගළපා වගුව තුළ ලියන්න. (තුම්බා, මන්කා, බ්‍රිජ්, පාලම්, පෙරියකුඩම්, මෙට්ටු, වාර්, සාදම්, වෙට්ටුතට්ටු, මෛදන්, සයාහී, බද්ධි)

| සංගීත භාණ්ඩයේ නම | විශේෂ ලක්ෂණ | සුවිශේෂව සම්බන්ධ වන සංකල්ප | සංගීත භාණ්ඩයට අදාළ කොටස් නාම |
|---|---|---|---|
| A .............. | වාදනය සඳහා "මිස්රාබ්" නම් කොටසක් යොදා ගනී. | වාසික්කම්තන්ද්, තාලතන්ද්, | ......................... |
| B .............. | ස, ප, ස, ප, ස, ප, ස. වශයෙන් සුසර කරනු ලබන ප්‍රධාන තත් හතකි. අනුනාද තත් නැත. | කායද, තිහායි, | ......................... |
| C ........... | භරත නාට්‍යම් සඳහා යොදාගන්නා අවනද්ධයකි. | ඛ්‍යාලා, මීන්ඩ් (සූත්) | ......................... |
| D ........... | දයං, බායාං වශයෙන් කොටස් දෙකකින් යුක්ත ය. | කලංගු, තක, දිමි | ......................... |

(ii) A, B හෝ C, D හෝ යන සංගීත භාණ්ඩ යුගල දෙකින් එක් යුගලක් තෝරා ගෙන එම යුගලයට අයත් සංගීත භාණ්ඩ දෙක අතර සම විෂකමම් **හතර** බැගින් දක්වන්න.

(iii) A හෝ D යන සංගීත භාණ්ඩ දෙකින් එකක් තෝරා ගෙන, එම භාණ්ඩය හා සුවිශේෂව සම්බන්ධ වන සංකල්ප තීරුවේ නිවැරදි කර ඔබ දැක්වූ සංකල්ප **දෙක** උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න.

(iv) ඉහත සංගීත භාණ්ඩ අතුරෙන් දක්ෂිණ භාරතීය සංගීත භාණ්ඩයක් තෝරා ගෙන, එම භාණ්ඩය වාදනය කරනු ලබන ස්වභාවය එහි ධ්වනි වර්ණය (Tone Colour) හෝ විශේෂත්වය ඇති කිරීමට බලපාන අයුරු පැහැදිලි කරන්න.

* * *